(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(11).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 ජනවාරි 15 සිකුරාදා**

**2021 මාර්තු 23 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

25/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ධාවනයෙන් ඉවත් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි අතරින් අලුත්වැඩියා කර නැවත ධාවනයට එක් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) එම දුම්රිය මැදිරි අලුත්වැඩියා කරන ලද ආයතනයේ නම කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ධාවනයෙන් ඉවත් කරන ලද සෙසු දුම්රිය මැදිරි යළි ධාවනයට එක් කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

171/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලෝලෙවල් මාර්ගයේ අඹතලේ සිට ඔරුගොඩවත්ත දක්වා කොටසේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර නොමැති බව දන්නේද;

(ii) එසේනම්, එම මාර්ගය සංවර්ධනය කිරීම ප්‍රමාද වීමට හේතුවන කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ මේ වනවිට සංවර්ධන කටයුතු නිම කර ඇති ප්‍රමාණය සහ තවදුරටත් නිම කිරීමට ඉතිරිව ඇති ප්‍රමාණය;

(ii) මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් දේපල අහිමිවූවන් අතරින් මේ වනවිට වන්දි ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ වන්දි මුදල;

(iii) තවදුරටත් වන්දි ලබා දීමට ඉතිරිව ඇත්නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, වන්දි මුදල සහ එම වන්දි ලබා දීමට අපේක්ෂිත දිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

181/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, ඌර්කාවට්තුරයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එලුවයිතිවු 4වන කලාපයේ පදිංචිව සිටි දියණියන් සයදෙනෙකුගේ පියකුවූ ඇන්ටනි යේසුදාසන් මහතා, 2014.12.19 දින එලුවයිතිවු මුහුදේ ධීවර කටයුතුවල යෙදී සිටියදී, නාවික හමුදාවේ ඩෝරා යාත්‍රාවක ගැටීමෙන් ජීවිතක්ෂයට පත්වූ බවත්;

(ii) නාවික හමුදාවේ නොසැළකිල්ලෙන් වූ මෙම අනතුරින් අසරණ වූ ඔහුගේ දියණිවරුන්ට වන්දියක් ලබාදෙන බවට පොරොන්දු වී ඇති බවත්;

(iii) මේ දක්වා වන්දි ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දරුවන්ට වන්දි ලබා දෙනු ලබන දිනය කවරේද;

(ii) මරණය සම්බන්ධයෙන් මීට සිව් වසරකට පෙර නඩුවක් පවරා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, නඩු අංකය, පැවරූ අය හා පැවරූ අධිකරණය කවරේද;

(iv) යාත්‍රාවක ගැටී මියගිය බවට ප්‍රබල සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කළද මෙතෙක් යුක්තිය ඉටු නොවූයේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුනට නාවික හමුදාව සහ පොලීසිය විසින් බලපෑම් කරන බව දන්නේද;

(ii) දරුවන්ට එවැනි බලපෑමක් නොකිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

196/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැය නවයක් පුරා ශ්‍රී ලංකාවේ විදුලිය විසන්ධි වූ දිනය කවරේද;

(ii) එකී විදුලිය විසන්ධි වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වූ අලාභය ගණනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

240/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

263/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2018-2019 මහ කන්නයේදී ගංවතුර උවදුර හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ වගා හානි වූ බවත්;

(ii) මේ වනතෙක් ඒ සඳහා වන්දි මුදල් ගෙවා නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් ගොවීන් දුෂ්කරතාවයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත කන්නය තුළදී මාතර දිස්ත්‍රික්කයේ හානි වූ වගා බිම් ප්‍රමාණය;

(ii) වන්දි මුදල් ගෙවිය යුතු ගොවීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙතෙක් වන්දි මුදල් නොගෙවීමට හේතු කවරේද;

(ii) උක්ත වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගය මේ වනවිට ඉදිකරමින් පවතින බවත්;

(ii) එම අධිවේගී මාර්ගයේ කොටසක් අලව්ව හා නාරම්මල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හරහා ඉදිකරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඉහත ප්‍රදේශවල ජීවත්වන පවුල්වලින් අත් කරගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම අත් කර ගැනීම් වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කර තිබේද;

(iii) නොඑසේ නම්, සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

457/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගල්කිරියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ, ගල්කිරියාගම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි වසමේ, මාතෘ සායනයක් පැවැත්වීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති බවත්;

(ii) ඉහත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ඇති, කිසිදු පහසුකමක් නොමැති කුඩා කාමරයක මේ වනවිට මෙම සායනය පවත්වන බවත්;

(iii) ඒ හේතුවෙන්, ගැබිනි මව්වරුන් අසීරුතාවයට පත්ව ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) මෙම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ගල්කිරියාගම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී වසම සඳහා මාතෘ සායන මධ්‍යස්ථානයක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

536/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි රජයට අයත් වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානයේ ගබඩා කළ හැකි ධාරිතාවය වෙන් වෙන් වශයෙන්කොපමණද;

(iv) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානයේ ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් කන්නය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම වී ගබඩා මධ්‍යස්ථාන ජාලය, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

720/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2016 වර්ෂයෙන් පසු විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයන් සඳහා 2020.01.01 දින සිට වැඩිවීමට නියමිතව තිබූ සංශෝධිත වැටුප ගෙවීම අත්හිටවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂය සඳහා වන අතුරු සම්මත ගිණුම මඟින් එම වැඩිවීමට නියමිතව තිබූ සංශෝධිත වැටුප ගෙවනු ලබන්නේද;

(ii) එසේ නම්, එම වැටුප ගෙවීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

(iii) 2020.01.01 දින සිට ගෙවිය යුතු හිඟ වැටුපද ඔවුනට ගෙවීමට අපේක්ෂා කරන්නේද;

(iv) එම සංශෝධිත වැටුප ලබා දිය යුතු විශ්‍රාමිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

724/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව, මන්නාරම සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඖෂධ වෙළඳසැල් (ඔසුසල්) පිහිටා නොමැති බවත්;

(ii) ඉහත දිස්ත්‍රික්කවල ජීවත්වන සාමාන්‍ය ජනතාව ඇතැම් ඖෂධ ලබා ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලබන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කවල මේ වනතෙක් රජයේ ඔසුසල් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(ii) එම දිස්ත්‍රික්කවල රජයේ ඔසුසල් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

730/2020

අමරකීර්ති අතුකෝරළ මහතා, — ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (2)

(අ) ශ්‍රී ලංකාවේ —

(i) වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ අවශ්‍යතාවය කොපමණද;

(ii) ඉහළම මිරිදිය මත්ස්‍ය අස්වැන්නක් ලබා දෙන දිස්ත්‍රික්කය කවරේද;

(iii) එම කර්මාන්තයේ නියැලෙන මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ජීවිකාව කරගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;

(iii) එම කර්මාන්තය සිදුකරන වැව් හා ජලාශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් හා ජලාශවලට මුදාහරින ලද මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ එම වැව් හා ජලාශවලින් ලද අස්වැන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුදා හරින ලද මත්ස්‍ය පැටවුන්ට සාපේක්ෂව ලද අස්වැන්න පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) කුඩා වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

783/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1989 – 1990 කාල සීමාව තුළ රජයේ ගුරු සේවයට බඳවා ගනු ලැබූ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම ගුරුවරුන් විශ්‍රාම යාමේ අවධියට ආසන්නව සිටින බවත්;

(ii) එම ගුරුවරු විශ්‍රාම යෑමත් සමඟ ගුරු සේවයේ විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) මෙම තත්ත්වය තුලනය කර ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

858/2020

ගරු ජගත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා හා මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය ජනාධිපතිවරණය ආසන්නයේදී, දේශපාලන හිතවත්කම් මත සමෘද්ධි ව්‍යාපාරයේ අරමුදල් අවභාවිතා කිරීම හා සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා දේශපාලන පදනමින් පත්වීම් ලබාදීම නීත්‍යානුකූල නොවන බව මැතිවරණ කොමිෂන් සභාව විසින් එවකට අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කරන තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒ සම්බන්ධයෙන් වර්තමාන රජය ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015.01.12 සිට 2015.06.26 කාලය තුළ සමෘද්ධි විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කළ අමාත්‍යවරයාගේ කාලයේදී රුපියල් ලක්ෂයේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය මුදල;

(ii) එසේ ලබා දුන් ණයවලින් මේ වනවිට අය වී ඇති මුදල;

(iii) තවදුරටත් අයවීමට ඉතිරිව තිබෙන මුදල;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එවකට පැවති රජය දේශපාලන පදනමින් තෝරා ගත් පිරිසක් සඳහා මෙම ණය ලබා දුන් බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ සාවද්‍ය ආකාරයෙන් ණය ලබා දීම පිළිබඳව ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1082/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම සේවකයන් අතරින් මේ වනවිට කොවිඩ්-19 රෝගය වැළදී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවකයන්ට කොවිඩ්-19 රෝගය වැළඳීම එරට සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයන්ට අහිතකර ලෙස බලපාන බව දන්නේද;

(ii) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 මාර්තු 24 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

47/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ දැනට පවතින රට බීම අළෙවිසැල් හෙවත් වයින් ස්ටෝර්ස් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකී එක් එක් රට බීම අළෙවිසැල් බලපත්‍ර ලාභීන්ගේ;

(i) නම්;
(ii) ලිපිනයන්;
(iii) බලපත්‍ර අංක;
(iv) බලපත්‍රය පළමු වරට නිකුත් කර ඇති දිනය හෝ වර්ෂය;
(v) එම ව්‍යාපාර පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනයන්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) 2000 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික රට බීම පරිභෝජනය;

(i) සැර ප්‍රතිශතය;
(ii) එක් එක් වෙළඳ නාමය;

අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

177/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රෝහලක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහල් පරිශ්‍රයේ ඉදිකරමින් පවතින මහල් 13කින් සමන්විත වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමීව සිදු කරනු ලබන බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;
(ii) ඊට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;
(iii) එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

197/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිබල අමාත්‍යාංශය මේ වනවිට පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය කවරේද;
(ii) එම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල හිමිකරුගේ නම හා ලිපිනය කවරේද;
(iii) ගොඩනැගිල්ල සඳහා ගෙවනු ලබන මාසික කුලිය කොපමණද;
(iv) ලංකා විදුලිබල මණ්ඩලය අධික මූල්‍යමය දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින අවස්ථාවක විදුලිබල අමාත්‍යාංශය පවත්වාගන යනු ලබන ගොඩනැගිල්ල සඳහා මාසිකව අධික කුලියක් ගෙවීම සම්බන්ධයෙන් දක්වන අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

241/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ලොකු ළූණු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම ලොකු ළූණු ආනයනය කළ රටවල් කවරේද;

(iv) ලොකු ළූණු ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ලොකු ළූණු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

353/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුරයේ පිහිටා ඇති තිසා වැව, විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අපිරිසිදු වී ඇති බවත්;

(ii) පානීය අවශ්‍යතා සඳහා සහ ආගමික කටයුතු සඳහා ජලය ලබා ගැනීම හේතුවෙන් අතීතයේ සිට එම වැවේ ස්නානය කිරීම, රෙදි සේදීම ආදී මානව ක්‍රියාකාරකම් තහනම් කර තිබූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) තිසා වැවේ ජලය පිරිසිදුව තබා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

537/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් විගමණික සේවකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම වැඩසටහන —

(i) ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iii) එමගින් මේ දක්වා ප්‍රතිලාභ ලබා ඇති දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම වැඩසටහන නැවැත්වීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපා ඇති කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

553/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජාතික මාර්ග, පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ගවල දුර ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මාර්ග අතරින්—

(i) කාපට් අතුරා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(ii) තාර දමා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(iii) තාර දමා හෝ කාපට් අතුරා නොමැති මාර්ගවල දුර ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් ග්‍රාමීය මාර්ග ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

595/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය, ඩෙල්ෆ්ට් දූපතේ පිහිටා ඇති එකම රෝහල වන ඩෙල්ෆ්ට් රෝහලේ අනුමත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර කවරේද;

(ii) පසුගිය වර්ෂ 08ක කාලය තුළ එම රෝහලට ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(iii) වෛද්‍යවරයෙක් පත් නොකිරීම හේතුවෙන් ඩෙල්ෆ්ට් දූපතේ ජීවත්වන ජනතාව මුහුණදෙන දුෂ්කරතා කවරේද;

(iv) එම ජනතාවට විශිෂ්ට වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා ඩෙල්ෆ්ට් රෝහලේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

609/2020

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1818 සහ 1819 වර්ෂවලදී සිදු වූ ඌව-වෙල්ලස්ස සටනට හම්බන්තොට ප්‍රදේශයෙන් නායකත්වය දුන් විරුවන් පිළිබඳ තොරතුරු, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නොමැති වීම සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ නිලධාරියෙකු විසින් සිදු කරනු ලබන පර්යේෂණයේ ප්‍රගතිය කවරේද;

(ii) එම විරුවන් රාජද්‍රෝහීන් ලෙස නම් කර ඇති බවට තොරතුරු ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම විරුවන්, ජාතික වීරවරයන් ලෙස නම් කිරීම සුදුසු බවට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් යෝජනා කර ඇති බව එවකට ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) වෙත යොමු කළ 2020.01.14 දිනැති ලිපියේ සඳහන් වන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

660/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනුවෙන් ආයතනයක් ශ්‍රී ලංකාවේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් කවරේද;

(ii) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය විසින් 2019 වර්ෂය තුළ නිකුත් කරඇති කැනීම් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලපත්‍ර ලබා දීම මගින් උපයාගෙන ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

731/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

(ii) අනුරාධපුරය හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල පවතින වියළි කාලගුණය අවසන්ව නැවත වැසි ලැබීමත් සමග මදුරු ගහනය වර්ධනය වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනතෙක් ඩෙංගු රෝගයට ගොදුරුවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඩෙංගු මදුරු කීටයන් විනාශ කිරීමට 2008/2009 වකවානුවේදී එවකට පැවති රජය විසින් B.T.I. බැක්ටීරියාව කියුබාවෙන් ආනයනය කිරීමට විවිධ උත්සාහයන් ගත් නමුත් එය අසාර්ථක වූ බවත් එතුමිය දන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට හැකියාවක් නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) B.T.I. බැක්ටීරියාව වෙනුවට ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිතා කළ හැකි විකල්පය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

745/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ගල්නෑව පොලිස් ස්ථානය ආරම්භ කරන ලද දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අබලන් තත්ත්වයක පවතින බවත්;

(ii) ආරම්භ කරන ලද දින සිට මේ වනතෙක් එම ගොඩනැඟිලි ප්‍රමාණවත් පරිදි අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) එම පොලිස් ස්ථානය සහ ඊට අයත් නිල නිවාස අලුත්වැඩියා කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

849/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පිබිදෙමු පොළොන්නරුව" දිස්ත්‍රික් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කඳුරුවෙල විකල්ප මාර්ගයේ කි.මී. 0 + 000 සිට කි.මී. 2 + 687 දක්වා වූ මාර්ග කොටස, මංතීරු 4ක මාර්ගයක් ලෙස පුළුල් කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට, රජයේ බීජ වී ගොවිපොළට අයත්වන සහ ප්‍රදේශවාසීන් විසින් භුක්ති විඳින ලද ගොඩ ඉඩම්, මඩ ඉඩම්, මුඩු ඉඩම්, ගෙවතු ඉඩම් සහ ස්ථිර ගොඩනැගිලි සහිත ඉඩම් රජයට පවරාගෙන තිබේද?

(ii) එසේ නම්, එලෙස පවරාගෙන ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) පවරාගත් ඉඩම්වල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වන්දි මුදලක් ගෙවා තිබේද;

(v) එසේ නම්, ගෙවනු ලැබූ වන්දි මුදල එක් එක් ඉඩම් හිමිකරු අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)හි සඳහන් මාර්ග කොටස පුළුල් කිරීම යටතේ මේ වනවිට වැඩ නිම කර ඇති දුර ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පාකිස්ථානය, නේපාලය, බංග්ලාදේශය, මාලදිවයින හා මියන්මාරය ඇතුළු 80 කට අධික රටවල් සංඛ්‍යාවක් කොවිඩ්-19 වසංගතයෙහි ආර්ථික බලපෑම හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වෙතින් හදිසි අවස්ථා ආධාර ලබා ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ආධාර ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, ඉල්ලා ඇති ආධාරවල ස්වභාවය කෙබඳුද;

(iii) ඉහත සඳහන් ආධාර ඉල්ලූ දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතිචාර දක්වා තිබේද;

(v) එසේ නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිචාරය කවරේද;

(vi) මේ දක්වා සහන ලැබී ඇති රටවල් 80 ට මෙන් ශ්‍රී ලංකා රජයට සහන ලැබී නොමැති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

1063/2020

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුම පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සැරිසරන වන අලින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වන අලින් පළවා හැරීමට සිටින නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) එම වන අලින් පළවා හැරීමට අදාළ නිලධාරින්ගේ හිඟය මගහරවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 මාර්තු 25 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

48/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට නිකුත් කර ඇති කැසිනෝ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් බලපත්‍රලාභීන්ගේ;

(i) නම්;

(ii) ලිපිනයන්;

(iii) බලපත්‍ර අංකයන්;

(iv) පළමුවරට බලපත්‍රය ලබා දී ඇති දිනයයන් හෝ වර්ෂයන්;

(v) කැසිනෝ ව්‍යාපාරයන් පවත්වාගෙන යන ස්ථානයන්ගේ ලිපිනයන්;

කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නව කැසිනෝ බලපත්‍ර සඳහා මේ වනවිට ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කොපමණද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

198/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තුළ මේ වනවිට පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අමාත්‍යාංශවල නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් අමාත්‍යාංශය පවත්වාගෙන යාම වෙනුවෙන් ගෙවනු ලබන කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රජයේ අමාත්‍යාංශ පවත්වාගෙන යාම සඳහා ඉහළ කුලී මුදලක් ගෙවීම සම්බන්ධයෙන් රජයේ අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

300/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඩුවෙල නගරයේ පවතින අධික රථ වාහන තදබදය අවම කිරීම සඳහා යම්කිසි වැඩපිළිවෙළක් රජය විසින් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

354/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින දිය ඇලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම සියලු දිය ඇලි ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කොට නීතිගත කර තිබේද;

(iii) නොඑසේ නම්, ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කොට නීතිගත කර නොමැති දිය ඇලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම දිය ඇලි ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිඳී ගොස් ඇති දිය ඇලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම මානව ක්‍රියාකාරකම් කවරේද;

(iii) ඊට වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සිඳී ගිය දිය ඇලි නැවත සක්‍රීය කිරීමට ඇති හැකියාව පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, සිඳී ගිය දිය ඇලි නැවත සක්‍රීය කරනු ලබන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

458/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර සිට කුරුණෑගල නගරයට ළඟාවිය හැකි කෙටිම මාර්ගය බුල්නෑව - පොල්පිතිගම මාර්ගය බවත්;

(ii) එම මාර්ගයේ තලාව හංදියේ සිට පොල්පිතිගම හංදිය දක්වා වූ කොටස මේ වනවිට අබලන් තත්ත්වයේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

538/2020

ගරු රෝහණ බංඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පාසල් සිසුන් ප්‍රවාහනය කිරීමේ "සිසුසැරිය" වැඩසටහන ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා යොදවා ඇති බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩසටහන අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

601/2020

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මධ්‍යම අධිවේගී මාර්ග —

(i) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) ව්‍යාපෘතියට මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට වැය කළ යුතු ඉතිරි මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබූ දිනය කවරේද;

(v) ව්‍යාපෘතියට අදාළව පසුගිය රජය සමයේ සිදුවූ අක්‍රමිකතා/ප්‍රමාදයන් හේතුවෙන් එය අවසන් කළ හැකි යැයි අනුමාන කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු —

(i) භාර දී ඇති සමාගම් කවරේද;

(ii) ප්‍රමාද කොට ඇති සමාගම්වලට එහි ඉදිකිරීම් කටයුතු නැවත පවරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතියේ මහනුවර නගරයට ආසන්න අවසන් පිවිසුම ඇති ප්‍රදේශය කවරේද;

(ii) මහනුවර සිට ගලගෙදර දක්වා වූ මාර්ගයේ පවතින දැඩි වාහන තදබදය හේතුවෙන් ඒ ඔස්සේ අධිවේගී මාර්ගයට පිවිසීමට විනාඩි 30 - 45 අතර කාලයක් ගත වන බැවින් මහනුවර ප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් අධිවේගී මාර්ගයට ප්‍රවිෂ්ට වීමට පිවිසුම් මාර්ග සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම අධිවේගී පිවිසුම් ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

661/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අලව්ව නගරය සංවර්ධන සැලැස්මකට අනුව ක්‍රමවත්ව සංවර්ධනය කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලව්ව නගරයට නගර සංවර්ධන සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

670/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ඉදිකරමින් පවතින පහළ උමා ඔය වාරි ව්‍යාපෘතිය මඟින් ඉදිකරනු ලබන වැව් හා ඇළමාර්ග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය මඟින් අස්වද්දනු ලැබිය හැකි ගොඩ හා මඩ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(v) එම මුදල සපයා ගත් අරමුදල් ප්‍රභවයන් කවරේද;

(vi) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

870/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වල මේ වනවිට සේවයේ නියුතු විදුහල්පතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ ඔවුන් අදාළ පාසල්වල විදුහල්පතිවරුන් ලෙස සේවය කරනු ලබන කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ජාතික පාසල් සඳහා නිසි සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් පත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

875/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනිකුත් රජයන් සහ බහුපාර්ශ්වික ආයතන ආදිය වෙතින් ණය පමා සහනයක් ඇතුළුව ණය සහනයන් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඉල්ලීම් කිහිපයක් සිදුකර තිබේද ;

(ii) එසේනම්, ණය පමා සහනය ඇතුළුව ණය සහන සඳහා ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා සිදුකර ඇති ඉල්ලීම්වල ස්වභාවය කවරේද;

(iii) ඉහත කී ඉල්ලීම් සිදුකරන ලද දිනය කවරේද;

(iv) ඉහත කී ඉල්ලීම් සඳහා ලැබී ඇති ප්‍රතිචාර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රජය වෙත අනුමත ප්‍රදානවලින් ලැබීමට ඉතිරිව ඇති ප්‍රදාන කවරේද;

(ii) ඉහත කී ප්‍රදානයන්ගේ වටිනාකම කොපමණද;

(iii) ශ්‍රී ලංකා රජය විසින් ඉහත කී ප්‍රදානයන් භාරගෙන නොමැත්තේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

997/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන විද්‍යාපීඨවල පුහුණු පාඨමාලාවන් මෑතකදී හදාරා අවසන්කර ඇති ඩිප්ලෝමාධාරීන් සඳහා මේ වනතෙක් ගුරු පත්වීම් ලබා දී නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් මැතක සිට ගුරු හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගුරු හිඟයට පිළියමක් ලෙසද, දරුවන්ගේ අධ්‍යාපනය ඉහල නැංවීම සඳහා ද විද්‍යා පීඨවල පුහුණු පාඨමාලාවන් හදාරා අවසන්කර ඇති මෙම ඩිප්ලෝමාධාරීන් සඳහා ගුරු පත්වීම් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1080/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 05 කාලය තුළ, පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාලය තුළ මියගිය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(iii) වකුගඩු රෝගය වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය විසින් ක්‍රියාත්මක කරන ලද, වකුගඩු රෝගීන් සඳහා මාසිකව අධාර මුදල් ලබා දීමේ වැඩසටහනට අලුතින් හඳුනාගනු ලැබූ වකුගඩු රෝගීන් ඇතුළත් කර නොමැති බවත්;

(ii) අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක නොවන බවත්;

එතුමිය දන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (i) සහ (ii) හි සඳහන් වැඩසටහන් විධිමත් පරිදි ක්‍රියාත්ම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1280/2020

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් කොපමණද;

(ii) ඉහළ ගම්මිරිස් අස්වැන්නක් ලබන දිස්ත්‍රික්කවල නම් කවරේද;

(iii) එම එක් එක් දිස්ත්‍රික්කයේ වාර්ෂික ගම්මිරිස් අස්වැන්න මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්මිරිස් හැර වෙනත් කුළුබඩු වර්ග ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) එම එක් එක් කුළුබඩු වර්ගයේ වාර්ෂික අවශ්‍යතාවය සහ ආනයනය කරනු ලබන ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආනයනය කරනු ලබන කුළුබඩු වර්ගවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/2020

ගරු වරුණ ලියනගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සිට මේ වනතෙක් හඳුනාගෙන ඇති, රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති අධි අවදානම් නිවාස සංඛ්‍යාව;

(ii) එම නිවාසවල පදිංචි වී සිටින නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමි වූ පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ඉහත සඳහන් අධි අවදානම් නිවාසවල පදිංචි වී සිටින පවුල් වෙනුවෙන් ප්‍රතිලාභ ලබා දීමේදී ප්‍රමාදයක් පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 මාර්තු 26 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

67/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අපද්‍රව්‍ය කළමණාකරණය යන විෂයය, පළාත් සභා යටතට ගැනෙන විෂයයක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, පළාත් සභා ක්‍රමය ආරම්භයේ සිට මේ වනතෙක් ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා වෙනම ආයතන ස්ථාපිත කර ඇති පළාත් සභාවල නම් කවරේද;

(ii) එවැනි විශේෂිත ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභාවල නම් කවරේද;

(iii) එවැනි ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභා සඳහා සුවිශේෂී ආයතනයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්,ඒ මන්ද?

199/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පවතින කැබිනට් අමාත්‍යාංශ සංඛ්‍යාව සහ රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම් ;

(iii) ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ රජයේ ගොඩනැගිලි වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

242/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වාහන අමතර කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වාහන අමතර කොටස් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එකී වාහන අමතර කොටස් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වාහන අමතර කොටස් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පානීය ජලය සපයන අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වැව්වල ජලයේ ගුණාත්මකභාවය පිරිහී ඇති බවත්;

(ii) E-coli ඇතුළු විෂබීජ අඩංගු වීම හේතුවෙන් එම ජලය ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පානීය ජලය ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වැව්වල නම් කවරේද;

(ii) එම වැව්වල ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

519/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාලච්චේන ධීවර වරාය තුළ සාමාන්‍ය ට්‍රෝලර් යාත්‍රා හැසිරවිය හැකි වුවත්, විශාල ප්‍රමාණයේ ට්‍රෝලර් යාත්‍රා හැසිරවීම සඳහා එහි පිවිසුම සහ ගැඹුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දේශීය ධීවරයින් ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්;

(ii) එම ධීවර වරාය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර වරාය පුළුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

543/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවා ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවා ගත් තනතුරු නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවා ගත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

671/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ඉදිකිරීම් ආරම්භ කරන ලද බිංගිරිය කිණියම වාරි ව්‍යාපෘතියේ යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා ගත වන කාලය කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතිය මඟින් පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

757/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) වන අලින්ගේ සංචරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) වන අලින් වැඩි වශයෙන් සංචරණය කරන ජාතික වනෝද්‍යාන හා රක්ෂිත වනාන්තර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අලි කොරිඩෝ තිබේ නම්, ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) අලි කොරිඩෝ හරස්වන ආකාරයට ගම්මාන හෝ ජනතාව පදිංචි ස්ථාන තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2020 සැප්තැම්බර් දක්වා දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුමෙන් —

(i) මියගිය පුද්ගලයන් හා වන අලින් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව;

(ii) හානි වී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iii) මියගිය හා දේපළ අහිමිවූවන්ට ගෙවා ඇති වන්දි මුදල එක් එක් පුද්ගලයා අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට ගත් නව ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

803/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කිළි / වට්ටක්කච්චි මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇති බවත්;

(ii) එම පාසල සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන, මුදා නොහැරීම හේතුවෙන් ශ්‍රවණාගාරය ඉදිකිරීම මේ වනවිට නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය කවරේද;

(ii) එම ප්‍රතිපාදන, මුදා නොහැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

(iii) එහි ඉදිකිරීම් සම්පූර්ණ කර සිසුන්ගේ භාවිතය සඳහා ලබා දීමට ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

871/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝව සතු මේ වනවිට ධාවනයේ යෙදවීමට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව කොපමණද ;

(iv) එම එක් එක් ඩිපෝවේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඩිපෝවල සේවය කරනු ලබන මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා හා එම ඩිපෝවල පවතින බස්රථ ඇණි වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

876/2020

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිදහස ලැබුණු දින සිට ණය ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් නොකැළැල් ඉතිහාසයක් පවත්වාගෙන යමින් සිටින ලද බව ශ්‍රී ලංකා රජය විසින් නොකඩවා ප්‍රකාශ කරන ලද බවත්;

(ii) මූඩි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනය විසින් ශ්‍රී ලංකාවේ ණය ආපසු ගෙවීමේ හැකියාව B2 සිට Caa1 දක්වා මට්ටම් දෙකකින් පහත දමා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද ?

(ආ) (i) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ පොලී සහ ක්‍රමක්ෂය ගෙවීම් වල මුළු වටිනාකම කවරේද ;

(ii) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත අයවැය හිඟය කවරේද ;

(iii) 2020 වර්ෂයේ පළමුවන, දෙවන හා තුන්වන කාර්තු සඳහා රජයේ ආදායම කවරේද;

(iv) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ණය ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව විසින් තම ණය ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය වෙත ඇතිවන බලපෑම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

881/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අවශ්‍යතාවය කොපමණද;

(ii) එම අවශ්‍යතාවයෙන් දේශීයව නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1982 වර්ෂයේදී උතුරු සහ නැගෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති යුදමය තත්ත්වය අවසන්ව මේ වනවිට අවුරුදු 11ක් ගත වුවද, 1982 වර්ෂයේදී එම පළාත්වලින් ලද මත්ස්‍ය අස්වැන්න මේ වනවිට නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ හඳුනාගත් ප්‍රදේශවල මේ වනතෙක් ධීවර වරායන් ඉදිනොකිරීමට හේතු කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ අනෙකුත් පළාත්වල ඉදිකරන ලද ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේදුරුතුඩුව ධීවර වරාය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(iv) මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ආධාරවල ස්වභාවය සහ එම ආධාර මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(v) නෝර්වේ සහ ඩෙන්මාර්ක් රටවලින් ලබා දෙන ණය මඟින් මෙම වරාය ඉදිකිරීමට හේතු කවරේද;

(vi) එමඟින් ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

934/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, මුල්ලියාවලයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 22ක් ආවරණය වන තැපැල් කාර්යාලය තාවකාලික ගොඩනැගිල්ලක පවත්වා ගෙන යනු ලබන බවත්;

(ii) ඒ සඳහා රු. 20,000/- ක මාසික කුලියක් ගෙවන බවත්;

(iii) එම තැපැල් කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකර දෙන ලෙස ජනතාව සහ පොදු සංවිධාන විසින් ඉල්ලීම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) මුල්ලියාවලයි ප්‍රදේශයේ ජීවත් වන ජනතාව වෙනුවෙන් ගුණාත්මක තැපැල් සේවයක් ලබා දීම සඳහා ඉහත තැපැල් කාර්යාලය වෙනුවෙන් ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ල ඉදිකරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1081/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේදී මේ වනතෙක් වරලත් ඉංජිනේරු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා නොසිටි බවත්;

(ii) එහෙත් ඒ සඳහා මෑතක සිට වරලත් ඉංජිනේරු තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා සිටින බවත්;

(iii) එම තත්ත්ව පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සඳහා රු. 25,000/- වඩා වැඩි මුදලක් වැය කිරීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඇම්පියර් 30 සහ 60 තෙකලා විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී, තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ඉල්ලා සිටීමේ ක්‍රමවේදය ඉවත් කිරීමට හෝ ඒ සඳහා සහනයක් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1083/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැද පෙරදිග රටවල පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා තානාපති කාර්යාල යටතේ සුරක්ෂා නිවාස පවතින බවත්;

(ii) එම සුරක්ෂා නිවාසවල පවතින ඉඩ කඩ ප්‍රමාණවත් නොවන බවත්;

(iii) ඒ හේතුවෙන් ආරක්ෂාව පතා එම නිවාසවලට පැමිණෙන ගෘහ සේවිකාවන් අසරණභාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම එක් එක් සුරක්ෂා නිවසේ මේ වනවිට රැඳී සිටින ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෘහ සේවිකාවන් නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?